# බන්ධනාගාර දෙපාර්තමේන්තුව

**<u>බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ හෙද නිලධාරි II "ආ" තනතුරට බඳවා ගැනීමට අයදුම්පත් කැඳවීම.</u>**

බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ හෙද සේවයේ II "ආ" තනතුරෙහි පවතින පුරප්පාඩු සඳහා පහත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. එම අයදුම්පත 2016/09/26 දිනට ප්‍රථම බන්ධනාගාර කොමසාරිස් ජනරාල්, බන්ධනාගාර මූලස්ථානය, නො : 150, බේස්ලයින් පාර, කොළඹ 09 වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහලන කවරයේ වම්පස උඩ කෙලවරේ "හෙද නිලධාරි තනතුර සඳහා බඳවා ගැනීම" යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතුය. පවතින හෙද නිලධාරි පුරප්පාඩු සංඛ්‍යාව 35 කි.

**02. සුදුසුකම්:-**

**02.1**

- සිංහල/ දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව සහ ඉංග්‍රීසි යන විෂයයන් 04ට සම්මාන සාමාර්ථ සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් (06) අ.පො.ස.( සා.පෙළ) විභාගය සමත්ව තිබීම.

**සහ**

- අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ දී විද්‍යා විෂයය ධාරාවට අයත්, ජීව විද්‍යාව/ ගණිතය/ කෘෂි විද්‍යාව විෂයය ධාරාවෙන් සියළුම විෂයයන්ගෙන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) එකවර සමත් වීම හෝ පැරණි විෂයය නිර්දේශය යටතේ විෂයයන් 03 කින් එක්වර සමත් වීම.

**03. කායික සුදුසුකම්:-**

I) සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම බන්ධනාගාරයක සේවය සඳහා අන් සෑම අයුරකින්ම ශාරීරික වශයෙන් යෝග්‍ය විය යුතුය.

II) පිරිමි - අවම උස අඩි 05 අඟල් 04<br>
කාන්තා - අවම උස අඩි 05 අඟල් 02

III) තනතුරෙහි රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

IV) අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

V) අවිවාහක වයස අවුරුදු 18 ට නොඅඩු 28 ට නොවැඩි ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතුය.

**04. බඳවා ගැනීමේ ක්‍රමය:-** 1990.03.09 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 15/90ට අනුකූලව විවෘත තරඟ විභාගයකින් සුදුස්සන් තෝරා ගැනෙනු ඇත.

I) බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය සෞඛ්‍ය අමාත්‍යාංශයේ උපදෙස් පරිදි විභාග දෙපාර්තමේන්තුව මගින් සිදු කෙරේ.

II) මේ සඳහා අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් සපුරා ඇති බන්ධනාගාර සේවයේ යෙදී සිටින නිලධාරින්ට ද **දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින්** ඒ සඳහා ඉල්ලුම් කළ හැකිය.

III) **බාහිර අයදුම්කරුවන්** අංක 01 අයදුම්පත අනුව ද **බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ නිලධාරින්** අයදුම්කරන්නේ නම්, අංක 02 අයදුම්පත මගින් ද ඉල්ලුම් කළ යුතුය.

(සේවා අවශ්‍යතාවය මත කාන්තා නිලධාරිනියන් බඳවා ගැනීමේ ප්‍රමාණය තීරණය කෙරේ.)

IV) තරඟ විභාගය :-

- භාෂාව - සිංහල/දෙමළ
- අභියෝග්‍යතාවය වශයෙන් ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ.

**05. වැටුප් ක්‍රමය:-** රු. 32525 – 10 x 445 -11 x 660 - 10 x 730 -10 x 750 – 59035 /= (රා.ප.ච. 03/2016 අනුව ගලපා වැටුප් ගෙවනු ලැබේ.)

**06. සේවා කොන්දේසි ආයතන සංග්‍රහයේ 11 වන පරිච්ඡේදයේ 10 සිට 12 දක්වා වගන්ති අදාළ වේ.**

**07. සේවයේ නියුක්ත කර වීමේ කොන්දේසි:-**

- තනතුර ස්ථිර ය විශ්‍රාම වැටුප් සහිත ය. වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.බඳවා ගනු ලබන සියළුම නිලධාරින් සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් පවත්වනු ලබන තුන් අවුරුදු පුහුණු පාඨමාලාවකට අනුයුක්ත කරනු ලබන අතර ඉන් සමත් යන අය ස්ථිර සේවයට බඳවා ගනු ලැබේ.
- රජය විසින් ගනු ලබන ප්‍රතිපත්ති තීරණ අනුව තනතුරෙහි නියුක්ත කරවීමේ කොන්දේසි වෙනස් විය හැකිය.
- පුහුණුවට කැඳවීමේදී දෙපාර්මේන්තුව සමඟ සේවා සැපයීම සඳහා ගිවිසුමකට බැඳී සිටිය යුතුය.

එච්.එම්.එන්.සී.ධනසිංහ<br>
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්,<br>
බන්ධනාගාර මූලස්ථානය, කොළඹ 09<br>
ටෙලි. අංකය : 011 4677177

එච්.එම්.එන්.සී. ධනසිංහ<br>
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්<br>
බන්ධනාගාර මූලස්ථානය<br>
කොළඹ 09.